
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


2023 ජනවාරි
05 වෙළුම 01 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2023 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 978ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.3කින් පහළ ගියේය.

2023 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,388ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 29.2කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)





### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)




2023 වසරේ ජනවාරි මාසය තුළ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන ආදායම සහ ආනයන වියදම, පිළිවෙළින්, සියයට 11.3කින් සහ සියයට 29.2කින් පහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ ජනවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 857ට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 410ක් දක්වා පහළ ගියේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජනවාරි)




# අපනයන ක්‍රියාකාරීත්වය

## අපනයන ක්‍රියාකාරීත්වය - ජනවාරි




## අපනයන පරිමා හා මිල දර්ශක - ජනවාරි





2023 වසරේ ජනවාරි මාසය තුළ දී, කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජමය නිෂ්පාදිත අපනයන යන සියලු ප්‍රධාන කාණ්ඩවල ඉපැයීම් පහළ යෑම හේතුවෙන් අපනයන ආදායම පහළ ගියේය.


2023 වසරේ ජනවාරි මාසය තුළ දී, අපනයන පරිමා දර්ශකය සියයට 5.3කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 15.7කින් පහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන


## කෘෂිකාර්මික අපනයන ආදායම





## කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරීත්වය (ජනවාරි)




## තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2023 වසරේ ජනවාරි මාසය තුළ දී ප්‍රධාන වශයෙන් පොල්, මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ඇතුළු බොහෝ කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම සමස්තයක් ලෙස පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, තේ සහ එළවළු ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන


කාර්මික අපනයන ආදායම





කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2023 වසරේ ජනවාරි මාසය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත ඇතුළු බොහෝ කාර්මික අපනයන ආදායම් සමස්තයක් ලෙස පහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි





ආනයන පරිමා හා මිල දර්ශකය - ජනවාරි





අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ඇතුළු සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ ජනවාරි මාසය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය ද, පිළිවෙළින්, සියයට 13.3කින් සහ සියයට 18.3කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


## පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





## පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




## පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





## සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත, විදුලි සංදේශ උපකරණ සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජනවාරි මාසය තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, සීනි සහ රසකැවිලි, පාන වර්ග සහ රථ වාහන සඳහා වන ආනයන වියදම ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


## අන්තර් භාණ්ඩ ආනයන වියදම





## අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



## අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)




## බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.
** 2023 වසරේ ජනවාරි මාසයේ බොරතෙල් ආනයන දත්ත ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබී නොමැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, රෙදි වර්ග), මූල ලෝහ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජනවාරි මාසය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, ඉන්ධන, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග සහ පොහොර ආනයන වියදම ඉහළ ගියේය.

# ආයෝජන භාණ්ඩ ආනයන


## ආයෝජන භාණ්ඩ ආනයන වියදම




## ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




## ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජනවාරි මාසය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජන. - දෙසැ. 2021 | ජන. - දෙසැ. 2022 | වෙනස (%) | ජන. 2022 | ජන. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **2,729.5** | **2,568.0** | **-5.9** | **204.5** | **191.0** | **-6.6** |
| එයින් | තේ | 1,324.4 | 1,258.8 | -5.0 | 91.2 | 99.6 | 9.1 |
| | පොල් | 425.2 | 400.3 | -5.9 | 33.3 | 22.0 | -34.1 |
| | කුළුබඩු | 454.8 | 368.7 | -18.9 | 35.0 | 34.1 | -2.7 |
| | මුහුදු ආහාර | 274.1 | 269.0 | -1.8 | 24.1 | 20.9 | -13.1 |
| **කාර්මික අපනයන** | | **9,702.0** | **10,465.3** | **7.9** | **891.9** | **781.3** | **-12.4** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 5,435.1 | 5,952.0 | 9.5 | 516.1 | 424.4 | -17.8 |
| | රබර් නිෂ්පාදිත | 1,050.4 | 977.0 | -7.0 | 82.0 | 72.7 | -11.4 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 506.4 | 568.0 | 12.2 | 67.2 | 46.4 | -30.9 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 586.9 | 519.5 | -11.5 | 41.7 | 34.7 | -16.7 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 500.9 | 580.9 | 16.0 | 44.6 | 50.8 | 13.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 276.7 | 450.6 | 62.8 | 31.9 | 54.1 | 69.6 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 58.4 | 85.8 | 46.9 | 4.3 | 5.2 | 23.1 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **67.1** | **73.2** | **9.1** | **6.1** | **5.9** | **-3.2** |
| **මුළු අපනයන** | | **12,498.6** | **13,106.4** | **4.9** | **1,102.6** | **978.2** | **-11.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජන. - දෙසැ. 2021 | ජන. - දෙසැ. 2022 | වෙනස (%) | ජන. 2022 | ජන. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **3,848.7** | **2,813.0** | **-26.9** | **360.0** | **218.5** | **-39.3** |
| ආහාර හා පාන වර්ග | | 1,666.5 | 1,607.9 | -3.5 | 187.2 | 118.3 | -36.8 |
| එයින් | එළවළු (ආ) | 384.3 | 318.4 | -17.1 | 29.6 | 24.1 | -18.5 |
| | සහල් | 73.0 | 292.5 | 300.5 | 56.6 | 2.1 | -96.3 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 2,182.2 | 1,205.1 | -44.8 | 172.8 | 100.2 | -42.0 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 882.5 | 533.4 | -39.6 | 78.9 | 51.0 | -35.4 |
| **අන්තර් භාණ්ඩ** | | **12,308.9** | **12,438.8** | **1.1** | **1,212.5** | **970.5** | **-20.0** |
| එයින් | ඉන්ධන | 3,742.9 | 4,896.8 | 30.8 | 430.3 | 481.1 | 11.8 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 3,066.9 | 3,065.2 | -0.1 | 316.5 | 217.5 | -31.3 |
| | පොහොර | 158.2 | 275.9 | 74.4 | 2.5 | 9.6 | 285.6 |
| | තිරිඟු හා ඉරිඟු | 418.3 | 303.1 | -27.5 | 41.7 | 5.6 | -86.7 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **4,479.8** | **3,039.2** | **-32.2** | **386.9** | **198.9** | **-48.6** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,809.5 | 1,969.0 | -29.9 | 243.8 | 132.6 | -45.6 |
| **මුළු ආනයන** | | **20,637.4** | **18,291.0** | **-11.4** | **1,959.4** | **1,387.9** | **-29.2** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජන. - දෙසැ. 2021 | ජන. - දෙසැ. 2022 | වෙනස (%) | ජන. 2022 | ජන. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ ශේෂය | -8,138.8 | -5,184.6 | | -856.8 | -409.8 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජන. - දෙසැ. 2021 | ජන. - දෙසැ. 2022 | වෙනස (%) | ජන. 2022 | ජන. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| අපනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 145.0 | 152.0 | 4.9 | 153.5 | 136.1 | -11.3 |
| | පරිමා දර්ශකය | 156.9 | 159.9 | 1.9 | 167.7 | 176.6 | 5.3 |
| | මිල දර්ශකය | 92.4 | 95.1 | 2.9 | 91.5 | 77.1 | -15.7 |
| ආනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 153.9 | 136.4 | -11.4 | 175.4 | 124.2 | -29.2 |
| | පරිමා දර්ශකය | 162.2 | 126.0 | -22.4 | 169.6 | 147.0 | -13.3 |
| | මිල දර්ශකය | 94.9 | 108.3 | 14.1 | 103.4 | 84.5 | -18.3 |
| වෙළඳ මිල අනුපාතය | | 97.4 | 87.8 | -9.9 | 88.5 | 91.3 | 3.1 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද